**මධ්‍යම පළාත් සභාවේ මහනුවර මහ නගර සභාවේ**

**ගෘහ නිර්මාණ ශිල්පී තනතුර සඳහා වන උසස් කිරීමේ පරිපාටිය.**

**1. සම්බන්ධ වන ආයතනය:**

1.1. මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය :

යොමු අංකය : CPC/CLG/1/9/6 දිනය : 2017.12.29

1.2. මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය :

යොමු අංකය : CPC/CMS/1/6/40 දිනය : 2018.02.09

1.3. කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම :

යොමු අංකය : DMS/CP/0601 වෙ.01 දිනය : 2017.02.23

1.4. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :

යොමු අංකය : CPC/CS/2/3/S.M./CLG දිනය : 2018.03.23

1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය : NSCC/10/71/KMC/SR දිනය : 2018.06.28

1.6. මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය : CPC/PSC/30/01/01 දිනය : 2019.04.09

**02. ව්‍යවස්ථාවේ නම** : මධ්‍යම පළාත් සභාවේ මහනුවර මහ නගර සභාවේ ගෘහ නිර්මාණ ශිල්පී තනතුර සඳහා වන උසස් කිරීමේ පරිපාටිය.

**03. ක්‍රියාත්මක වන දිනය** : මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක වේ.

**04. පත්කිරීමේ බලධරයා** : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

4.1 තනතුර අයත් ආයතනය : මහනුවර මහ නගර සභාව

4.2 තනතුර අයත් අමාත්‍යාංශය : මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය

**05. සේවා ගණය පිළිබඳ විස්තර**

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.07 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

5.1. සේවා ගණය : විධායක

5.2 ශ්‍රේණි : III / II /I

5.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

මහනුවර මහා නගර සභාවේ ගෘහ නිර්මාණ ශිල්පීන් වශයෙන් මහනුවර නගරය තුල ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයේදී වාස්තු විද්‍යා මූලධර්ම අනුව ගොඩනැගිලි සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, නිර්මිත පරිසරය ගොඩනැගීම හා වාස්තු විද්‍යානුකූලව අදාල විශේෂඥ උපදෙස් ලබා දීම යන සියළුම කාර්යයන් මෙම තනතුරේ කාර්යයන් යටතට ගැනේ.

5.4 කාර්යයන් පැවරීම :

ගෘහ නිර්මාණ ශිල්පී තනතුරට අයත් ඉහත කාර්යයන් පැවරීම ආයතන ප්‍රධානියා විසින් සිදු කරනු ලැබේ.

**6.** තනතුරෙහි /තනතුරු වල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

**7.** වැටුප්

(කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ DMS/CP/0601 වෙ.1 හා 2017.02.23 දිනැති ලිපිය අනුව)

7.1 වැටුප් කේත අංකය : SL 1-2016

7.2 වැටුප් පරිමාණය : රු. 47,615 - 10 x 1,335 - 8x 1,630 - 17x 2,170 - 110,895/-

7.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | 01 පියවර | රු. 47,615 /- |
| II | 12 පියවර | රු. 62,595/- |
| I | 20 පියවර | රු. 76,175/- |

7.4 වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතුය.

සටහන: මහනුවර මහ නගර සභාවට ගෘහ නිර්මාණ ශිල්පී III ලෙස ස්ථිර පත්වීම් ලබන අවස්ථාවේදී පූර්ණ වෘත්තීය සුදුසුකම් (වරලත් වාස්තු විද්‍යාඥ තත්ත්වය) හෝ බඳවා ගැනීමෙන් පසු එම තත්ත්වය ලබාගත් විට එම නිලධාරියා එම ශ්‍රේණියේ 5 වන වැටුප් පියවරේ පිහිටුවනු ලැබේ. එවැනි නිලධාරියෙකු වුවද සේවයට බැඳී වසර 03ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු වේ.

**8.** සේවා ගණයට අයත් තනතුර :

8.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාමය | අනුමත තනතුරු ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ගෘහ නිර්මාණ ශිල්පී | III / II /I | 01 | • මහනුවර මහා නගර සභාවේ ගෘහ නිර්මාණ ශිල්පීන් වශයෙන් මහනුවර නගරය තුල ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයේදී වාස්තු විද්‍යා මූලධර්ම අනුව ගොඩනැගිලි සැලසුම් කිරීම, නිර්මාණය කිරීම නිර්මිත පරිසරය ගොඩනැගීම හා වාස්තු විද්‍යානුකූලව අදාල විශේෂඥ උපදෙස් ලබා දීම.<br>• මහනුවර ජීවමාන ලෝක උරුම නගරයේ සාම්ප්‍රදායික වාස්තු විද්‍යාත්මක ලක්ෂණ වලට හා මහනුවර සාම්ප්‍රදායික භූ දර්ශනයට ගැලපෙන සේ යෝජිත ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා අවශ්‍ය වාස්තු විද්‍යාත්මක උපදෙස් ලබා දීම.<br>• මහනුවර ලෝක උරුම නගරය සංරක්ෂණය කිරීම සඳහා පුරා විද්‍යා දෙපාර්තමේන්තුව හා නාගරික සංවර්ධන අධිකාරිය මගින් ලයිස්තුගත කර ඇති ගොඩනැගිලි වාස්තු විද්‍යාත්මකව සංරක්ෂණය කිරීම සඳහා උපදෙස් ලබාදීම.<br>යන සියළුම කාර්යයන් මෙම තනතුරේ කාර්යයන් යටතට ගැනේ. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.06.07 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

8.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 02

**9. කාර්යක්ෂමතා කඩඉම්** :

9.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගත වීමට පෙර | 02 පරිශිෂ්ඨය |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගත වීමට පෙර | 02 පරිශිෂ්ඨය |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගත වීමට පෙර | 02 පරිශිෂ්ඨය |

9.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද යන වග :

පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වසරකට දෙවරක් පැවැත්වේ.

9.3 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන බලධරයා කවරෙක්ද යන වග :

**1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය** - රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ මත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින්

**2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය** - ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය මගින් පූර්ණ වෘත්තිය සුදුසුකම් ලබා ගැනීම (මෙය නිලධාරියා විසින් ලබා ගත යුතුය.)

**3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය** - පූර්ණ වෘත්තිය සුදුසුකම් පවත්වාගෙන යාම (මෙය නිලධාරියා විසින් පවත්වාගෙන යා යුතුය)

10. භාෂා ප්‍රවීණතාවය:

10.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට බැඳුනු නිලධාරියෙකු සේවයේ ස්ථිර කිරීමට පෙර රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| සන්ධාන භාෂාව | සේවයේ ස්ථිර කිරීමට පෙර අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් සමත්වී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය. (වෛකල්පිත විෂයක් වශයෙන් නොවේ) |

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.07 දින අනුමත කරන ලදී.

**11. ශ්‍රේණි උසස් කිරීම :**

සංලක්ෂය: (කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ DMS/CP/0601 වෙ.1 හා 2017.02.23 දිනැති ලිපියේ III ඡේදය අනුව මෙම බඳවා ගැනීමේ පරිපාටියට අන්තර්ග්‍රහණය වීමෙන් පසු සේවා කාලය හා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථාවේ සුදුසුකම් උසස් කිරීමේ පරිපාටියට ඇතුලත් කර එම අවශ්‍යතා සපුරා ලීම මත උසස් වීම් ලබා දිය යුතු වේ.)

ආණ්ඩුකාර ලේකම්

## 11.1 සේවයේ III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

### 11.1.1 සාමාන්‍ය කාර්යය සාධනය අනුව

#### 11.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්යයසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. සන්ධාන භාෂා ප්‍රවීණතා මට්ටම ලබාගෙන හෝ එයින් නිදහස් කරනු ලැබ තිබීම.

VI. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

VII. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

#### 11.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධාරියා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සම්පූර්ණ කරන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

## 11.2 සේවයේ II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

### 11.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හත (07) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක හත (07) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්යයසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබීම.

IV. පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම.

V. වාස්තු විද්‍යා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.07 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

11.2.1.1 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන නිලධාරියා විසින් නියමිත ආකෘතිය අනුව පත් කිරීම් බලධාරියා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සම්පූර්ණ කරන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

12. තනතුරු වලට පත් කිරීම :

මහනුවර මහා නගර සභාවේ දැනට සේවයේ නියුතු ගෘහ නිර්මාණ ශිල්පීන් සඳහා පමණක් අදාල වේ. මෙම නිලධාරීන් සේවයෙන් ඉවත් වූ පසු මෙම තනතුරු සඳහා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථාවේ නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ.

13. පොදු කොන්දේසි :

ස්ථිර කිරීම, සේවයෙන් පහකිරීම, සේවය හැර යාම, විශ්‍රාම ගැන්වීම ආදී පොදු විධිවිධාන හා සම්බන්ධ පොදු කොන්දේසි ආයතන සංග්‍රහය හා කාර්යය පරිපාටික රීති අනුව වේ.

14. අර්ථ නිරූපණ හා නිර්වචන :

14.1 "උසස් කිරීමේ පටිපාටිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ මහනුවර මහ නගර සභාවේ ගෘහ නිර්මාණ ශිල්පී තනතුර සඳහා වන උසස් කිරීමේ පරිපාටිය වේ.

14.2 "ක්‍රියාත්මක දිනය" යන්නෙන් මෙම පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමා අනුමත කරනු ලබන දිනය අදහස් වේ.

14.3 "ව්‍යවස්ථාව" යන්නෙන් ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාව අදහස්වේ.

14.4 "ගරු ආණ්ඩුකාරතුමා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා හෝ ගරු ආණ්ඩුකාරතුමිය වේ.

14.5 "රාජ්‍ය සේවා කොමිෂන් සභාව" යන්නෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අදහස් වේ.

14.6 "ආයතන ප්‍රධානියා" යන්නෙන් මහනුවර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වරයා අදහස් වේ.

14.7 "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස්වරයා වේ.

14.8 "ගැසට් පත්‍රය" යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය වේ.

14.9 "සතුටුදායක සේවා කාලය" යනු රජයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්වීම මගින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු /ඇය විසින් දඩුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.07 දින
අනුමත කරන ලදී.
[signature]
ආණ්ඩුකාර ලේකම්

14.10 "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු ලැබේ.

14.11 "පූර්ණ වෘත්තීය සුදුසුකම්" යන්නෙන් ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ පූර්ණ හා අඛණ්ඩ සාමාජිකත්වය ලබා එහි වෘත්තීය මට්ටමේ තෙවන කොටස සම්පූර්ණ කර වරලත් වාස්තු විද්‍යාඥයෙකු වශයෙන් ලියාපදිංචි වී සිටීම අදහස් කෙරේ.

14.12 "ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය" යනුවෙන් අදහස් කරන්නේ 1982 අංක 09 දරන පනත යටතේ ස්ථාපිත කොට ඇති ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වේ.

## 15. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

15.1. අන්තර්ග්‍රහණ පොදු කොන්දේසි :-

I. උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතු නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ.

II. උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට MN 6 2006 / 2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබමින් ගෘහ නිර්මාණ ශිල්පී තනතුරක සේවය කරන නිලධාරීන් III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. උසස්වීම් ලබා දීමේදී අන්තර්ග්‍රහණය වීමෙන් පසු සේවා කාලය අදාළ කර ගනු ලැබේ.

III. අන්තර්ග්‍රහණය කිරීමේදී ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තිය ප්‍රකාරව වැටුප් පරිවර්තනය කරනු ලැබේ.

IV. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/CP/0601 වෙ.1 හා 2017.02.23 දිනැති ලිපිය මගින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 යටතේ MN 6 වැටුප ලබා දී ඇති ගෘහ නිර්මාණ ශිල්පී නිලධාරීන්ට පෞද්ගලික වන සේ SL 1-2016 වැටුප ගෙවීම අනුමත කර ඇත. ඒ අනුව වැටුප් පරිවර්තනයේදී වැටුප් පරිමාණය ලෙස SL 1-2016 සළකනු ලැබේ. එම සංශෝධිත වැටුප මෙම උසස් කිරීමේ පරිපාටියට අන්තර්ග්‍රහණය කරනු ලබන දින සිට ගෙවනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.07 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III වන ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් සඳහා පැවැත්වෙන 8 වන ඡේදයේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය විෂය නිර්දේශය

**පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

| අනු අංකය | විෂය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| 01 | මූල්‍ය ක්‍රම | පැය 03 | 100 |
| 02 | පරිපාලනය | පැය 03 | 100 |
| 03 | දෙපාර්තමේන්තු රෙගුලාසි | පැය 03 | 100 |

1. පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයකදී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර තිබේ.

2. විභාග පරිපාටිය

<u>I. රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය</u>

පහත සඳහන් විෂය ක්ෂේත්‍ර ආවරණය වන එක් ප්‍රශ්න පත්‍රයකි.

(අ) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය

- රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන
- රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය
- අරමුදල යන්නෙහි අර්ථය
- ඒකාබද්ධ අරමුදල හා එහි ක්‍රියාකාරීත්වය
- විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම
- අනිවිශ්චිත අවස්ථා අරමුදල
- වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරීත්වය
- රාජ්‍ය ආදායම
- මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යභාරය
- භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය
- වොරන්ට් හා අග්‍රිම අධිකාරිය
- විගණකාධිපති ඔහුගේ බලතල හා කාර්යභාරය

I කොටස (I) ඡේදය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය - 2014.08.28

- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA)
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE)

(ආ) ගණන් දීමේ නිලධාරීන්, ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ ගණන් දීමේ නිලධාරීන් පත්කිරීම, එම නිලධාරීන්ගේ බලතල හා කාර්යභාරය/ වගකීම් හා වගකීම් ස්වභාවය

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඈ) රාජ්‍ය වියදම් සැලසුම් කරණය හා කළමනාකරණය

- සංවිධාන වල අරමුණු හා කාර්යභාරයන් හඳුනාගැනීම
- රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩසටහන් හඳුනා ගැනීම
- සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන් සැලසුම් කිරීම හා ඇගයීම් ප්‍රමුඛතාකරණය
- වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තුව සැකසීම සහ අවසන් තීරණ ගැනීම

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.07 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

(ඉ) අනුමත ඇස්තමේන්තු වල වෙනස්කම් කිරීම

- විරමෝං පරිපාටිය ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය
- මුළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම
- පරිපූරක ඇස්තමේන්තු

(ඊ) රජයේ දේපල වල පාඩු හා අත්හැරීම්

(උ) විවිධ ගිණුම් කටයුතු

(ඌ) මූල්‍ය කළමනාකරණය සඳහා කාර්යයන් පැවරීම)

(එ) රජයේ මුදල්වල භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය

(ඒ) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය

- රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය
- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

සටහන - අපේක්ෂකයෙකු ලකුණු 40% ලබාගත යුතු ය.

**II. පරිපාලනය - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්**

(අ) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII සහ XLVIII

(ආ) අංක 30/1589 දරන 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති

සටහන - අපේක්ෂකයෙකු ලකුණු 40% ලබාගත යුතු ය.

( I කොටස (I) ඡේදය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය - 2014.08.28)

**III. දෙපාර්තමේන්තු රෙගුලාසි**

දෙපාර්තමේන්තු රෙගුලාසි වෙනස්වන නිසා මෙම සේවයේ සියළු නිලධාරීන්ට පොදු පරීක්ෂණයක් පැවැත්වීම අපහසු වේ. එබැවින් මෙම විෂය සඳහා විෂය නිර්දේශ සකස් කර අදාළ අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ඇතිව අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් එම පරීක්ෂණය පැවැත්වීමට අදාළ සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ක්‍රියාකළ යුතු ය.

**දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

- ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ II ශ්‍රේණියට උසස්වී වසර තුනක් ඇතුළත අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ වෘත්තිය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු ය. එනම් ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ සාමාජිකත්වය ලබා ගත යුතු ය. (සේවයට බැඳෙන අවස්ථාවේ පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ඇති නිලධාරීන් එය අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය.)

**තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

- පූර්ණ වෘත්තිය සුදුසුකම් අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.05.07 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු

| | | | |
|---|---|---|---|
| 01. | ටී.බී.එච්. දුණුවිල මහතා | (සභාපති) | ............................ |
| 02. | ඩබ්ලිව්.එම්.එස්.ඩී. වීරකොන් මහතා | (සාමාජික) | ............................ |
| 03. | ඒ.එම්. වයිස් මහතා | (සාමාජික) | ............................ |
| 04. | ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා | (සාමාජික) | ............................ |
| 05. | එන්.ඩී.කේ.පියුම්සිරි මහතා | (සාමාජික) | ............................ |
| 06. | ජී. තෙන්නකෝන් මහතා | (සාමාජික) | ............................ |
| 07. | කේ.ආර්. ක්‍රිෂාන් මහතා | (සාමාජික) | ............................ |

දිනය 2019.04.09

ආණ්ඩුකාර ලේකම්,

2019.04.09 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 19/449 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සභාවේ මහනුවර මහ නගර සභාවේ ගෘහ නිර්මාණ ශිල්පී තනතුර සඳහා වන උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2019.04.09

............................
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

නිල මුද්‍රාව
එම්.ජී.ඒ. තිලකරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : අනුමත කරමි / නොකරමි.

අනුමත කරමි / නොකරමි

ජනාධිපති නීතිඥ
මෛත්‍රී ගුණරත්න
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත.

2019.05.07